# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය/ පුස්ථකාලයාධිපති තනතුර

**<u>සුදුසුකම්</u>**

**01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර**

i. පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයන්හි මහාචාර්යවරයෙකු ලෙස වසර අටක (08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

(අ) අදාළ ක්ෂේත්‍රයෙහි ආචාර්ය උපාධියක් ලබා තිබිය යුතය.

හෝ

(ආ) සුවිගත කළ සඟරා ප්‍රකාශන විස්සක් (20)

හෝ

ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උසස් ආචාර්ය උපාධියක් (D.Sc. හෝ D.Litt. හෝ LL.D හෝ ඊට සමාන උපාධියක්) ලබා ඇති මහාචාර්යවරයෙක් විය යුතුය.

සහ

iii. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සලකාබලනු ලැබිය හැකි වෙනත් නිර්ණායක තෘප්ත කර තිබිය යුතුය.

**02. මහාචාර්ය තනතුර**

i. අදාළ ක්ෂේත්‍රයෙහි ආචාර්ය උපාධියක් ලබා තිබිය යුතය.

හෝ

සුවිගත කළ සඟරා ප්‍රකාශන විස්සක් (15)

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි දක්වා ඇති පරිදි කථිකාචාර්ය (පරිවාස) ලෙස සුදුසුකම් ලබාගැනීමෙන් පසුව වසර පහළොවක (15) සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

iii. මහාචාර්ය ධූරය සඳහා ලකුණු ලබාදීමේ පටිපාටියෙහි දක්වා ඇති අවම ලකුණු ප්‍රමාණය ලබාගත යුතුය.

සහ

iv. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සලකාබලනු ලැබිය හැකි වෙනත් නිර්ණායක තෘප්ත කර තිබිය යුතුය.

**03. පුස්තකාලයාධිපති තනතුර**

1. අ. පළමුපෙළ හෝ දෙවනපෙළ (ඉහළ සමාර්තයක්) සහිත විශේෂ උපාධියක්

හෝ

ආ. දෙවනපෙළ (පහළ සමාර්තයක්) සහිත විශේෂ උපාධියක්

හෝ

පළමුපෙළ හෝ දෙවනපෙළ (ඉහළ සමාර්තයක්) සහිත සාමාන්‍ය උපාධියක්

හෝ

ඇ. ප්‍රථම උපාධිය සමඟ නිබන්ධනයක් වැනි පර්යේෂණ පැවරුමක් සහිත පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකකට නොඅඩු කාල සීමාවකින් යුත් පශ්චාත් උපාධියක් සමත් වී තිබීම.

සහ

2. නිබන්ධන වර්ගයේ පරියේෂණ සංරචකයක් සහිත අවම වශයෙන් පූර්ණ කාලීන වසර දෙකක අධ්‍යයන කාලසීමාවකින් යුතු (හෝ සමාන අර්ධ-කාලීන) පුස්තකාල සහ විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අචාර්ය උපාධියක් සම්පූර්ණ කර තිබීම.

සහ

3. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කර තිබීම.

සහ

4. ප්‍රථම උපාධිය ලබාගත් පසු අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද හෝ ඉහත 2 හි දැක්වෙන සුදුසුකම් ලබා ගත් පසු, පහත දැක්වෙන ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍ර දෙකෙහිම වසර 10 ක පළපුරුද්ද

අ. පිළිගත් පුස්තකාලයක පුස්තකාලයාධිපති තනතුරෙහි පළපුරුද්ද

ආ. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ වල නිරත වූ පළපුරුද්ද.

සහ

5. පුසතකාලයාධිපති තනතුර සඳහා වන ලකුණු පරිපාටියෙහි අවම වශයෙන් අවම ලකුණු මට්ටම ලබා ගැනීම.

<u>සටහන</u>

(අ) ඉහත (1) ඇ යටතේ පිළිගන්නා ලද පශ්චාත් උපාධියකට ඉහත 2 යටතේ නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවන් චක්‍රලේඛයට අනුව ඔවුන්ගේ අයදුම්පත සමඟ ස්වයං ඇගයීම (Self Evaluation) ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ සටහන - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය/ පුස්තකාලයාධිපති තනතුර සඳහා අයදුම් කරන අපේක්ෂකයින් සඳහා**

1. මහාචාර්ය තනතුර සඳහා අයදුම් කරන අපේක්ෂකයින් වයස අවුරුදු 60 නොඉක්මවිය යුතුය.

2. අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රය සහ ස්වයං ඇගයුම සමග එහි සදහන් කර ඇති පරිදි සියලුම උපකාරක ලියිකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඇගයීම් ක්‍රියාවලිය හා සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ඇත.

4. විදේශගතව සිටින අයදුම්කරුවන් විද්‍යුත් තැපෑල හරහා ලේඛන ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලුම් කල විටක මුද්‍රිත පිටත් ඉදිරිපත් කළ යුතුය.

5. ඉදිරිපත් කළ යුතු ලේඛන සදහා ඉංග්‍රීසි සුදුසුකම් ලේඛනය සඳහා යොමු වන්න.

**වැටුප් පරිමාණ**

01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර :- U-AC 5 (I) Rs. 139,175 -11x2,925 -171,350 p.m
+ (167% අධ්‍යයන දීමනාව) + වෙනත් අනුමත දීමනා

02. මහාචාර්ය තනතුර : - U-AC 5 (II) Rs. 117,350 - 13x2,700 – 152,450 p.m.
+ (162% අධ්‍යයන දීමනාව) + වෙනත් අනුමත දීමනා

03. පුස්ථකාලයාධිපති තනතුර : - U-AC 5 (II) Rs. 117,350 - 13x2,700 – 152,450 p.m.
+ (162% අධ්‍යයන දීමනාව) + වෙනත් අනුමත දීමනා

**වෙනත් ප්‍රතිලාභ**

- සුදුසුකම් ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු
- අධ්‍යන දීමනා සහ පර්යේෂණ දීමනාව
- සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය
- විශ්‍රාම පාරිතෝෂික දීමනාව
- නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්
- වාර්ෂික දිරි දීමනා
- සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- විශ්වවිද්‍යාලයීය රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය සහ වෙනත් වරප්‍රසාද